# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2275/02 - 2022 අප්‍රේල් මස 13 වැනි බදාදා - 2022.04.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය එම්. යූ. එම්. අලි සබ්රි වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2021 අප්‍රේල් මස 26 දිනැති අංක 2225/1 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියමය 2022 අප්‍රේල් මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මෙම නියමය 2022 අප්‍රේල් මස 14 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**එම්. යූ. එම්. අලි සබ්රි,**
මුදල් අමාත්‍ය.

2022 ක් වූ අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.


1A - PG 5813— 485 (2022/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| I වන තීරය | | | | II වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු. 200 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් (රේගු සං. ව. සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් සහ රේගු සංකේතාංක 0303.55 යටතට වැටෙන ජැක් සහ හෝස් මැකරල් (Jack and horse mackerel - Trachurus spp./ මසුන් හැර) | 10% හෝ කි. ග්‍රෑමයට රු. 200 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 2 | 03.05 | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක | කි. ග්‍රෑමයට රු. 302.00 |
| 3 | 07.13 | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි. ග්‍රෑමයට රු. 40.00 |
| 4 | 07.13 | 0713.40.11 | සම්පූර්ණ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1713.40.12 | පියළිකළ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.21 | සම්පූර්ණ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.22 | පියළිකළ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට ශත 25 |
| 5 | 08.04 | 0804.50.50 | මැංගුස්ටීන් - අළුත් | කි. ග්‍රෑමයට රු. 200.00 |
| | | 0804.50.60 | මැංගුස්ටීන් - වියළි | කි. ග්‍රෑමයට රු. 200.00 |
| 6 | 08.10 | 0810.50 | කිවිප්‍රැට් | කි. ග්‍රෑමයට රු. 175.00 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.